සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

10677

## 7 - ශ්‍රේණිය

## නර්තනය

නම/විභාග අංකය :- ..............................................................................

කාලය : පැය 01 1/2යි.

❖ **දී ඇති උපදෙස් හොඳින් කියවන්න.**

❖ **අංක 01 සිට 15 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. 16 - 20 දක්වා ප්‍රශ්න තෝරාගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් කොටසකි.**

උදා : ඔබ ඉගෙන ගන්නේ උඩරට නර්තන සම්ප්‍රදාය නම් පිළිතුරු ලිවිය යුත්තේ එම කොටසට අයත් අංක 16- 20 දක්වා ප්‍රශ්නවලට පමණි.

### I කොටස

- **නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) අවකාශය බෙදෙන ප්‍රධාන කොටස් දෙක වන්නේ,
(i) පුද්ගල හා පොදු අවකාශය ලෙසය. (ii) පොදු හා හිස් අවකාශය ලෙසය.
(iii) පුද්ගල හා පෞද්ගලික අවකාශය ලෙසය. (iv) පොදු හා විධිමත් අවකාශය ලෙසය.

(02) තනි තිතේ ප්‍රභේද ගණනින්,
(i) පහකි. (ii) හතකි. (iii) තුනකි. (iv) හයකි.

(03) ''දුර යන තරමට පුදුම නොවෙල්ලා'' යන කවි පදය අයත් වන්නේ,
(i) ඔංචිලි වාරම් කවි සඳහාය. (ii) කුළු කවි සඳහාය.
(iii) ලී කෙළි කවි සඳහාය. (iv) සවරං කවි සඳහාය.

(04) විනෝදය හා සතුට ප්‍රකාශ කිරීම සඳහා වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩයකි.
(i) තම්මැට්ටම (ii) රබාන (iii) බෙරය (iv) දවුල

(05) තිත වාදනය කිරීම සඳහා යොදාගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩය,
(i) පන්තේරුව (ii) උඩැක්කිය (iii) බෙරය (iv) තාලම්පට

(06) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහි මූලික අංගහාරය මේ නමින් හඳුන්වයි.
(i) පා සරඹ (ii) මණ්ඩිය (iii) දණ්ඩියම (iv) හැඩතල

(07) 'ඒ වත්ත මේ වත්ත - තේ වත්ත ගාවා' යන රබන් පදය නිවැරදි ප්‍රස්තාර කළ හැක්කේ,
(i) මැදුම් මහ දෙතිතට (ii) සුළු මැදුම් දෙතිතට (iii) සුළු මහ දෙතිතට (iv) මැදුම් තනි තිතට

(08) කුලු නැටුම් සඳහා උචිත කවි නිර්මාණය වී ඇත්තේ,
(i) රත්නවල්ලි කවිවලින්ය. (ii) කළගෙඩි මාලේ කවිවලින්ය.
(iii) පැදුරුමාලේ කවිවලින්ය. (iv) ඔංචිලිවාරම් කවිවලින්ය.

(09) සෙතක් ශාන්තියක් ප්‍රාර්ථනා කිරීමේ අරමුණ ඇතිව ගායනා කරනු ලබන කවි විශේෂය වන්නේ,
(i) වන්නම් කවි (ii) ප්‍රශස්ති කවි (iii) ආශිර්වාද කවි (iv) හටන් කවි

(10) උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන්හි පාද හුරු කරගැනීමේ මූලික අභ්‍යාස මෙනමින් හඳුන්වනු ලබයි.
(i) අත් සරඹ හා පා සරඹ (ii) පා සරඹ හා දොඹින පද
(iii) ගොඩ සරඹ හා දොඹින පද (iv) ඉලංගම් සරඹ හා දොඹින පද

- **ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| (11) සමන් දේවාල පෙරහැර | නිදහස් උත්සවය |
| (12) තාලානුකූල චලන ගීතයකි | දඬු බෙරය |
| (13) ආදේශ භාණ්ඩයකි | රූපවාහිනිය |
| (14) ජාතික උත්සවයකි | මහබඹා කෝලම |
| (15) ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයකි | ඇහැළ මලින් |

- **ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය තෝරාගෙන පිළිතුරු සපයන්න.**
  **අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ලියන්න.**

## උඩරට සම්ප්‍රදාය

(16) උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩ සරඹ අවසන් කරන පදය ........................................ නමින් හැඳින්වේ.

(17) 'සත්වෙත් මහත් අදර' ........................................ වන්නමට අයත් කවි පදයකි.

(18) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ........................................ වේ.

(19) මහනුවර ප්‍රදේශයට ආවේණික ප්‍රධාන පෙරහැර ........................................ වේ.

(20) 'දොං ජිංත ගතදොංත' මෙම බෙරපදය ........................................ තිතට වාදනය කරනු ලබයි.

## පහතරට සම්ප්‍රදාය

(16) පහතරට නර්තන සම්ප්‍රදායේ ඉලංගම් සරඹ අවසන් කරන පදය ........................................ නමින් හැඳින්වේ.

(17) 'ගෙන අතින සිරිවැසය' ........................................ ට අයත් කවි පදයකි.

(18) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ........................................ වේ.

(19) දෙවුන්දර ප්‍රදේශයට ආවේණික ප්‍රධාන පෙරහැර ........................................ වේ.

(20) 'ගුංදෙගත ගත්ත ගුං' මෙම බෙරපදය ........................................ තිතට වාදනය කරනු ලබයි.

## සබරගමු සම්ප්‍රදාය

(16) සබරගමු නර්තන සම්ප්‍රදායේ මාත්‍රාපද අවසන් කරන පදය ........................................ නමින් හැඳින්වේ.

(17) 'සත්නෙත් රජුන් පොරණ' ........................................ ට අයත් කවි පදයකි.

(18) සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ........................................ වේ.

(19) රත්නපුර ප්‍රදේශයට ආවේණික ප්‍රධාන පෙරහැර ........................................ වේ.

(20) 'ජිං ජිමිත තත් තතට ' මෙම බෙරපදය ........................................ තිතට වාදනය කරනු ලබයි.

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු ලිවිය යුතු සියලු ප්‍රශ්න සංඛ්‍යාව තුනකි.

(01) 1. ඔබ ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදාය නම් කරන්න. (ලකුණු 02)
2. එම නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
3. නම් කරන ලද සම්ප්‍රදායට අයත් ප්‍රධාන ශාන්ති කර්මය නම් කරන්න. (ලකුණු 02)
4. එම ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණක් ලියන්න. (ලකුණු 02)
5. එම ශාන්ති කර්මයට අයත් නර්තන අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

මුළු ලකුණු (ලකුණු 10)

(02) 1. තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)
2. තුරඟා වන්නමට අයත් බෙරපදය හෝ 'සරල කවිතාලයේ බෙරපදය' හෝ කුදිරඩි වන්නමේ බෙරපදය ලියන්න. (ලකුණු 03)
3. තුරඟා වන්නමට අයත් කවියක් හෝ සරල කවිතාලයට අයත් කවියක් හෝ කුදිරඩි වන්නමට අයත් කවියක් ලියන්න. (ලකුණු 04)

(03) 1. ගැමි නැටුම් තුනක් නම් කරන්න. (ලකුණු 03)
2. එම නැටුම්වලට අදාළ රංග භාණ්ඩ තුනක් ලියන්න. (ලකුණු 03)
3. නම් කරන ලද ගැමි නැටුමකට අයත් කවියක් ලියන්න. (ලකුණු 04)

(04) 1. රූපවාහිනියෙන් ඔබ නැරඹූ ළමා නර්තන වැඩසටහන් තුනක් නම් කරන්න. (ලකුණු 03)
2. මහනුවර දළදා පෙරහැරෙහි දුටු නර්තන අංග තුනක් ලියන්න. (ලකුණු 03)
3. ඔබ සිත්ගත් නර්තන අංගයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 04)